# (60) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය** - කාලය පැය 01යි.
බහුවරණ ප්‍රශ්න 40කින් සමන්විත වේ. **ව්‍යාපාර අධ්‍යයනය විෂය කොටසින් ප්‍රශ්න 16ක් ද ගිණුම්කරණය විෂය කොටසින් ප්‍රශ්න 24ක්** ද ඇතුළත් වන ලෙස මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

**II පත්‍රය** - කාලය පැය 02යි. මුළු ලකුණු 60කි.
පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර, ඊට අමතරව I කොටසෙහි ප්‍රශ්න තුනකින් දෙකකටත්, II කොටසෙහි ප්‍රශ්න තුනකින් දෙකකටත් වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.

අනිවාර්ය පළමුවන ප්‍රශ්නය - මෙය කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 10කින් සමන්විත වන අතර ඉන් **ප්‍රශ්න හතරක් ව්‍යාපාර අධ්‍යයනය විෂය කොටසින්** ද, **ප්‍රශ්න හයක් ගිණුම්කරණය විෂය කොටසින්** ද සකස් කෙරේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

I කොටස - **ව්‍යාපාර අධ්‍යයනය**
මෙම කොටස ව්‍යාපාර අධ්‍යයනය විෂයට අදාළ ව්‍යුහගත ප්‍රශ්න තුනකින් සමන්විත වන අතර, ඉන් දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 08 බැගින් ලකුණු 16කි.

II කොටස - **ගිණුම්කරණය**
මෙම කොටස ගිණුම්කරණය විෂයට අදාළ ව්‍යුහගත ප්‍රශ්න තුනකින් සමන්විත වන අතර, ඉන් දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් ලකුණු 24කි.

අවසාන ලකුණ ගණනය කිරීම :

| | | |
|---|---|---|
| I පත්‍රය | = | 40 |
| II පත්‍රය | = | 60 |
| අවසාන ලකුණ | = | 100 |

### I පත්‍රය

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

● පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක **1** සිට **4** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ආහාර තාක්ෂණවේදී උපාධිධාරිනියක වන මිහිරි, දේශීය නැවුම් පළතුරු අලෙවි කරන වෙළෙඳසලක් පවත්වාගෙන යන්නී ය. ඇය ප්‍රදේශයේ සිටින කාබනික පොහොර භාවිත කර පළතුරු වගා කරන ගොවීන්ගෙන් පළතුරු මිල දී ගෙන, ඒවා ප්‍රණීත්ගේ ආපන ශාලාවට සහ පාරිභෝගිකයන්ට අලෙවි කරයි.

**1.** මිහිරිගේ පළතුරු වෙළෙඳසල විසින් සපුරාලනු ලබන වුවමනාවක් වන්නේ,

(1) ආහාර ය. (2) ජෑම් ය. (3) අඹ ය. (4) සෞඛ්‍යය ය.

**2.** මෙම සිද්ධියේ සඳහන් මිහිරිගේ පළතුරු ව්‍යාපාරය,

(1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) සේවා සපයන ව්‍යාපාරයකි.
(3) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි. (4) හවුල් ව්‍යාපාරයකි.

**3.** මිහිරිගේ පළතුරු ව්‍යාපාරයේ ශක්තියක් වන්නේ,

(1) මිහිරි ආහාර තාක්ෂණවේදී උපාධිධාරිනියක් වීම ය.
(2) මිහිරිට ඉලක්ක වෙළෙඳපොලක් පැවතීම ය.
(3) අවට ආපනශාලාවක් තිබීම ය.
(4) කාබනික පොහොර භාවිත කර පළතුරු නිෂ්පාදනය කරන ගොවීන් සිටීම ය.

**4.** ඉහත සිද්ධියට අදාළ වන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) පළතුරු ගොවීන්, මිහිරිගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයක් නොවේ.
(2) පාරිභෝගිකයින්, මිහිරිගේ ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශවයකි.
(3) මිහිරිගේ පළතුරු වෙළෙඳසලට නෛතික පුද්ගලභාවයක් ඇත.
(4) ප්‍රනීත් මිහිරිගේ ව්‍යාපාරයේ හවුල්කරුවෙකි.

**5.** හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන නිවැරදි ව වර්ගකර ඇති පිළිතුර තෝරන්න.

(1) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
(2) පෞද්ගලික අංශයේ ව්‍යාපාර, රාජ්‍ය අංශයේ ව්‍යාපාර
(3) රාජ්‍ය අංශයේ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර
(4) ලාභ අරමුණු කරගත් ව්‍යාපාර, පෞද්ගලික අංශයේ ව්‍යාපාර

**6.** බුද්ධික විසින් ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කර එහි කළමනාකරණ කටයුතු තමා විසින් ම කරගෙන යාමට අදහස් කරයි. මේ සඳහා වඩාත් සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,

(1) ඒක පුද්ගල ව්‍යාපාරයකි. (2) හවුල් ව්‍යාපාරයකි.
(3) සමිති සංවිධානයකි. (4) සංස්ථාපිත සමාගමකි.

**7.** සමන්ත කුමාරසිංහ විසින් තම ව්‍යාපාරය "සමන්ත ස්ටෝර්ස්" නමින් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය ලියාපදිංචිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමෙන් නෛතික පුද්ගලභාවයක් ලැබේ.
(2) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
(3) මෙම ව්‍යාපාරයේ නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(4) මෙම ව්‍යාපාරය සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ යුතු ය.

**8.** චෙක්පත් මගින් ගණුදෙනු කිරීමට අපේක්ෂා කරන ආයෝජකයෙකු .................... ආරම්භ කළ යුතු ය. ඉහත හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර තෝරන්න.

(1) මහජන බැංකුවේ, ඉතිරි කිරීමේ ගිණුමක්
(2) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ, ජංගම ගිණුමක්
(3) ලංකා බැංකුවේ, ජංගම ගිණුමක්
(4) ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ, ඉතිරි කිරීමේ ගිණුමක්

**9.** චෙක්පතක මුහුණත හරහා ඇඳ ඇති සමාන්තර රේඛා දෙකක් අතර හෝ සමාන්තර රේඛා නොමැතිව වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම,

(1) සාමාන්‍ය රේඛනයයි. (2) අගරු කිරීමයි.
(3) පිටසන් කිරීමයි. (4) විශේෂ රේඛනයයි.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 10 හා 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
කමල් සිය පෞද්ගලික මෝටර් රථයෙන් ව්‍යාපාරික කටයුත්තක් සඳහා ඔහුගේ ව්‍යාපාරය වන KP එන්ටප්‍රයිසස් වෙත ගමන් කරමින් සිටියදී රිය අනතුරකට භාජනය විය. කමල් ඔහුගේ පෞද්ගලික ජංගම දුරකථනයෙන් මෝටර් රථය රක්ෂණය කර තිබූ ජාතික රක්ෂණ සමාගමට ඒ බව දැනුම් දෙන ලදී.

**10.** ඉහත සිද්ධියේ සඳහන් රක්ෂණයට සම්බන්ධ පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කමල්, ජාතික රක්ෂණ සමාගම (2) ජාතික රක්ෂණ සමාගම, කමල්
(3) KP එන්ටප්‍රයිසස්, ජාතික රක්ෂණ සමාගම (4) ජාතික රක්ෂණ සමාගම, KP එන්ටප්‍රයිසස්

**11.** ඉහත සිද්ධියේ දැක්වෙන අනතුරු ජාතික රක්ෂණ සමාගමට දැනුම් දීම සඳහා කමල් භාවිත කළ සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදන ක්‍රමය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වාචික/ විද්‍යුත්, ජංගම දුරකථනය
(2) ජංගම දුරකථනය, වාචික/ විද්‍යුත්
(3) ජංගම දුරකථනය, විද්‍යුත්/ ලිඛිත
(4) දුරකථන සංවාද, විද්‍යුත්/ ලිඛිත

**12.** ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය, මාධ්‍යය, බලය හා පර්යන්තය සඳහා නිදසුන් අනුපිළිවෙලින් පෙළගැස්සූ විට, නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ජල මාර්ගය, ගුවන් යානා, බස්නැවතුම, ගෑස්
(2) මහා මාර්ගය, ගෑස්, නැව්, වරාය
(3) ජල මාර්ගය, නැව්, ඛනිජ තෙල්, වරාය
(4) මහා මාර්ගය, බස්, බස්නැවතුම, ඛනිජ තෙල්

**13.** පහත ව්‍යාපාර අතුරෙන් සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් වනුයේ,
(1) පූජා භූමියක් අසල වන්දනාකරුවන්ට මල් අලෙවි කිරීම ය.
(2) ලොතරැයි මණ්ඩලය විසින් නියෝජිතයින්ට ලොතරැයි අලෙවි කිරීම ය.
(3) බේකරි හිමියකු විසින් පාසලේ ආපනශාලාවට බේකරි නිෂ්පාදන අලෙවි කිරීම ය.
(4) නුවරඑළියේ එළවළු ගොවීන් විසින් ආර්ථික මධ්‍යස්ථාන වෙත එළවළු අලෙවි කිරීම ය.

**14.** පහත X තීරුවේ කළමනාකරණ කාර්යයන් ද, Y තීරුවේ එම එක් එක් කාර්යයට අදාළ කටයුතු ද දැක්වේ.

| X | Y |
|---|---|
| (i) සැලසුම්කරණය | (A) අලෙවි කළමනාකරු වෙළෙඳ සහායකයින්ගේ කටයුතු අධීක්ෂණය කිරීම |
| (ii) සංවිධානකරණය | (B) 5% කින් විකුණුම් ඉහළ නැංවීමට තීරණය කිරීම |
| (iii) මෙහෙයවීම | (C) විකුණුම් ඉහළ ගිය ප්‍රතිශතය පරීක්ෂා කිරීම |
| (iv) පාලනය | (D) වෙළෙඳ සහායකයින් බඳවා ගැනීම |

ඉහත X තීරුවේ සඳහන් කළමනාකරණ කාර්යයන්, Y තීරුවේ කටයුතු සමඟ අනුපිළිවෙලින් ගැළපූ විට නිවැරදි පිළිතුර වනුයේ,
(1) B, A, D, C (2) B, C, A, D (3) B, D, A, C (4) B, D, C, A

**15.** ආයෝජකයකු සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් (1) ................. ආදායමක් ලබන අතර, ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් (2) ................. ආදායමක් ලබයි. ඉහත (1) හා (2) ස්ථාන සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ප්‍රාග්ධන ලාභ, ලාභාංශ
(2) ප්‍රාග්ධන ලාභ, පොළී
(3) පොළී, ප්‍රාග්ධන ලාභ
(4) ලාභාංශ, පොළී

**16.** ධනපාල තමා ඉතිරි කර ගත් මුදලක් ආයෝජනය කිරීමට අදහස් කරයි. ඔහුගේ අපේක්ෂා පහත පරිදි වේ.
- මාස තුනක දී ආයෝජන මුදල් ආපසු ලබා ගැනීම
- ආයෝජනය සඳහා පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම
- අවදානම අවම කර ගැනීම

ධනපාලට වඩාත් සුදුසු ආයෝජන මාර්ගය වනුයේ,
(1) සාමාන්‍ය කොටස් මිල දී ගැනීම ය.
(2) දේපල මිල දී ගැනීම ය.
(3) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම ය.
(4) භාණ්ඩාගාර බිල්පත් මිල දී ගැනීම ය.

**17.** කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ වටිනාකම් පහත දැක්වේ.

| වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|
| රු. 100 000 | = | රු. 75 000 | + | රු. 25 000 |

අයිතිකරු රු. 5 000 ක් පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීමෙන් පසු ඉහත ගිණුම්කරණ සමීකරණයෙහි අගයන් නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | රු. 105 000 | = | රු. 75 000 | + | රු. 30 000 |
| (2) | රු. 95 000 | = | රු. 70 000 | + | රු. 25 000 |
| (3) | රු. 100 000 | = | රු. 75 000 | + | රු. 25 000 |
| (4) | රු. 95 000 | = | රු. 75 000 | + | රු. 20 000 |

**18.** පහත ගනුදෙනු අතුරෙන් හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුවක් වනුයේ,

(1) අයිතිකරු තම පෞද්ගලික පරිභෝජනය සඳහා රු. 10 000ක් ව්‍යාපාරයෙන් ලබා ගැනීම

(2) රු. 2 000ක් විදුලිබිල ගෙවීම

(3) අයිතිකරු රු. 10 000ක අතිරේක ප්‍රාග්ධනය යෙදවීම

(4) රු. 300 000ක් වටිනා යන්ත්‍රයක් මිල දී ගැනීම

**19.** ණයගැතියන්ගෙන් රු. 20 000ක චෙක්පතක් ව්‍යාපාරයට ලැබීම සටහන් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) මුදල් ගිණුම | හර | රු. 20 000 | (2) බැංකු ගිණුම | හර | රු. 20 000 |
| ණයගැති ගිණුම | බැර | රු. 20 000 | ණයගැති ගිණුම | බැර | රු. 20 000 |
| (3) බැංකු ගිණුම | හර | රු. 20 000 | (4) ණයගැති ගිණුම | හර | රු. 20 000 |
| මුදල් ගිණුම | බැර | රු. 20 000 | බැංකු ගිණුම | බැර | රු. 20 000 |

**20.** පහත X තීරුවේ ගිණුම් වර්ග ද, Y තීරුවේ එම ගිණුම්වල සටහන් කරන අයිතම ද දැක්වේ.

| X | Y |
|---|---|
| (i) වත්කම් ගිණුම | (A) දුන් වට්ටම් |
| (ii) වගකීම් ගිණුම | (B) විකුණුම් |
| (iii) හිමිකම් ගිණුම | (C) ලී බඩු |
| (iv) ආදායම් ගිණුම | (D) ගැනිලි |
| (v) වියදම් ගිණුම | (E) ණයහිමියෝ |

X තීරුවේ සඳහන් ගිණුම් වර්ග, Y තීරුවේ සඳහන් අයිතම සමඟ අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,

(1) C, E, D, A, B ය. (2) C, E, B, D, A ය. (3) C, E, D, B, A ය. (4) C, E, B, A, D ය.

**21.** ව්‍යාපාරයක බැංකු ගිණුමේ බැර ශේෂය,

(1) වත්කමකි. (2) වගකීමකි. (3) ආදායමකි. (4) වියදමකි.

**22.** ණයගැතියකුගෙන් ව්‍යාපාරයට ලැබුණු රු. 5 000ක චෙක්පත එම අවස්ථාවේ දී ම බැංකුවේ තැන්පත් කිරීම ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කිරීමේ දී භාවිත කරන මූලාශ්‍ර ලේඛනය (1)........... වන අතර මූලික සටහන් පොත (2)............වේ. ඉහත (1)..... හා (2)..... යන ස්ථාන සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ලදුපත, මුදල් පොත (2) ලදුපත, බැංකු ගිණුම

(3) චෙක් තැන්පතුපත, මුදල් පොත (4) චෙක් තැන්පතුපත, බැංකු ගිණුම

**23.** ව්‍යාපාරයක 2016.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු.15 500ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු.16 000ක් විය. මෙම වෙනසට හේතුවන ගනුදෙනුව තෝරන්න.

(1) බැංකුව විසින් අයකරගත් රු. 500ක බැංකු ගාස්තු

(2) බැංකුවට සෘජුව ම ලැබී තිබූ ආයෝජන ආදායම රු. 500

(3) ස්ථාවර නියෝග මත බැංකුව අයකරගත් රු.500ක රක්ෂණ වාරිකය

(4) තැන්පත් කළ නමුත් නිෂ්කාෂණය නොවූ චෙක්පත් රු. 500

**24.** කමල්ගේ ව්‍යාපාරයේ ණයහිමියකු වූ නිමල්ට රු. 10 000 ක ණය මුදලක් ගෙවීමේ දී 5% ක වට්ටමක් හිමි වී ඇත. මෙය කමල්ගේ ව්‍යාපාරයේ,

(1) රු. 10 000ක දුන් වට්ටමකි. (2) රු. 10 000ක ලද වට්ටමකි.

(3) රු. 500ක දුන් වට්ටමකි. (4) රු. 500ක ලද වට්ටමකි.

**25.** සුළු මුදල් අග්‍රිමය රු. 3 000ක් වන ව්‍යාපාරයකට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

- 2016.01.31 දිනෙන් අවසන් මාසය තුළ වැය වූ සුළු මුදල් වියදම රු. 2 950කි.
- 2016 පෙබරවාරි මස 01 දින සිට ව්‍යාපාරයේ අග්‍රිමය රු. 4 000 දක්වා වැඩි කිරීමට තීරණය කරන ලදී.

මෙම ව්‍යාපාරයේ අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම සඳහා 2016.02.01 දින සුළු මුදල් භාරකරුට ලබාදිය යුතු මුදල වන්නේ,

(1) රු. 1 050 කි. (2) රු. 2 950 කි. (3) රු. 3 950 කි. (4) රු. 4 050 කි.

**26.** "ශක්ති" ලී බඩු වෙළෙඳ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

A - ලීබඩු අත්පිට මුදලට ගැණුම් රු. 100 000

B - "ගැමුණු" ලීබඩු වෙළෙඳුන්ගෙන් ලීබඩු ගැණුම් රු. 200 000

C - "ඇල්ෆා" සමාගමෙන් ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා කාර්යාල උපකරණ ණයට ගැණුම් රු. 50 000

D - අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලීබඩු ගැණුම් රු. 20 000

E - "අගනා" ලීබඩු වෙළෙඳුන්ගෙන් ලීබඩු ගැණුම් රු. 100 000

ඉහත ගනුදෙනුවලින් "ශක්ති" ව්‍යාපාරයේ ගැණුම් ජ'නලයේ සටහන් කරන ගනුදෙනු වනුයේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) B හා E ය. (4) C හා E ය.

**27.** පළතුරු බීම නිෂ්පාදනය කරන ව්‍යාපාරයක අයිතිකරු විසින් පළතුරු බීම බෝතල් 100ක් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගැනීම සටහන් කරන මූලික සටහන් පොත වනුයේ,

(1) පොදු ජ'නලයයි. (2) ගැණුම් ජ'නලයයි.
(3) විකුණුම් ජ'නලයයි. (4) සුළු මුදල් පොතයි.

**28.** ව්‍යාපාරයක ශේෂ පිරික්සුමේ හර පැත්තේ එකතුව රු. 350 000ක් වූ අතර, බැර පැත්තේ එකතුව රු. 345 000ක් විය. මෙම වෙනස නිසා ව්‍යාපාරයේ අවිනිශ්චිත ගිණුමේ,

(1) රු. 5 000ක හර ශේෂයක් පවතී. (2) රු. 5 000ක බැර ශේෂයක් පවතී.
(3) රු. 345 000ක හර ශේෂයක් පවතී. (4) රු. 350 000ක බැර ශේෂයක් පවතී.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **29** හා **30** ට පිළිතුර සපයන්න.

අරුණළු ක්‍රීඩා සමාජයේ 2015.01.01 දිනට සිටි සාමාජිකයින් සංඛ්‍යාව 150කි. එක් සාමාජිකයෙකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50කි. 2015 වර්ෂය තුළ දී සාමාජිකයන් 120 දෙනෙකු වර්ෂයට අදාළ සාමාජික මුදල් ගෙවා තිබුණි.

**29.** 2015 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

(1) රු. 6 000 කි. (2) රු. 7 500 කි. (3) රු. 72 000 කි. (4) රු. 90 000 කි.

**30.** 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් කළ යුතු සාමාජික මුදල කොපමණ ද?

(1) රු. 7 500 කි. (2) රු. 18 000 කි. (3) රු. 72 000 කි. (4) රු. 90 000 කි.

**31.** නිෂ්පාදන පිරිවැයේ මූලිකාංග නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) නිෂ්පාදන පිරිවැය = ප්‍රාථමික පිරිවැය + ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රමය පිරිවැය + ඍජු වෙනත් පිරිවැය

(2) නිෂ්පාදන පිරිවැය = ප්‍රාථමික පිරිවැය + වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රමය පිරිවැය + වක්‍ර වෙනත් පිරිවැය

(3) නිෂ්පාදන පිරිවැය = ඍජු ද්‍රව්‍ය පිරිවැය + ඍජු ශ්‍රමය පිරිවැය + වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර වෙනත් පිරිවැය

(4) නිෂ්පාදන පිරිවැය = වක්‍ර ද්‍රව්‍ය පිරිවැය + වක්‍ර ශ්‍රමය පිරිවැය + වක්‍ර වෙනත් පිරිවැය + නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය

**32.** මැටි බඳුන් නිෂ්පාදනය කරන ආයතනයක මුරකරුට ගෙවා තිබූ රු. 10 000 ක වැටුප,

(1) ඍජු ශ්‍රම පිරිවැයකි. (2) වක්‍ර වෙනත් පිරිවැයකි.
(3) ඍජු වෙනත් පිරිවැයකි. (4) වක්‍ර ශ්‍රම පිරිවැයකි.

**33.** 2015.12.31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමේ සඳහන් විදුලි ගාස්තුව රු. 12 000ක් විය. තව ද එදිනට පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ උපචිත විදුලිය ලෙස රු. 1 200ක් සඳහන් වී තිබුණි. මෙම ව්‍යාපාරයේ වාර්ෂික විදුලි ගාස්තු වියදම වන්නේ,

(1) රු. 1 200 කි. (2) රු. 10 800 කි. (3) රු. 12 000 කි. (4) රු. 13 200 කි.

**34.** වෙළෙඳ ව්‍යාපාරයකට අදාළ අයිතම කිහිපයක් පහත දැක්වේ.

- අත්පිට විකුණුම්
- අත්පිට ගැණුම්
- ණයට ගැණුම්
- ණයට විකුණුම්
- පැටවුම් ගාස්තු
- ගෙන ඒමේ කුලී

ඉහත අයිතම ඇසුරෙන් මිල දී ගත් තොගයේ පිරිවැය නිවැරදි ව නිරූපණය කරන පිළිතුර වනුයේ,

(1) අත්පිට ගැණුම් + ණයට ගැණුම් + පැටවුම් කුලී + ගෙනඒමේ කුලී

(2) අත්පිට විකුණුම් + ණයට විකුණුම් + පැටවුම් කුලී + ගෙනඒමේ කුලී

(3) අත්පිට ගැණුම් + අත්පිට විකුණුම් + පැටවුම් කුලී + ගෙනඒමේ කුලී

(4) ණයට ගැණුම් + ණයට විකුණුම් + පැටවුම් කුලී + ගෙනඒමේ කුලී

**35.** වත්කම් = හිමිකම් + වගකීම් යන සමීකරණය මගින් නිරූපණය කරන මූල්‍ය ප්‍රකාශය වනුයේ,

(1) ලැබීම් හා ගෙවීම් ගිණුමයි. (2) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයයි.

(3) ආදායම් ප්‍රකාශයයි. (4) ආදායම් වියදම් ප්‍රකාශයයි.

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් අංක **36** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දිල්ෂාන්ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කළ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ප්‍රාග්ධනය | | 800 000 |
| 2015.01.01 දිනට ඉතිරි තොගය | 5 000 | |
| ගැණුම් | 80 000 | |
| විකුණුම් | | 200 000 |
| 10% බැංකු ණය | | 20 000 |
| බෙදාහැරීමේ වෑන් රථය - පිරිවැයට | 200 000 | |
| ගොඩනැගිලි - පිරිවැයට | 670 000 | |
| 2015.01.01 දිනට ක්ෂය වෙන් කිරීම | | |
| බෙදා හැරීමේ වෑන් රථය | | 20 000 |
| රක්ෂණ ගාස්තු | 2 000 | |
| ලැබූ විකුණුම් කොමිස් | | 4 000 |
| විකුණුම් සේවක වේතන | 30 000 | |
| බැංකුණය පොළී | 2 000 | |
| ණයගැතියෝ | 12 000 | |
| ණය හිමියෝ | | 11 000 |
| බොල්ණය | 1 000 | |
| පරිපාලන වේතන | 40 000 | |
| බැංකු අයිරාව | | 16 000 |
| මුදල් ශේෂය | 29 000 | |
| | 1 071 000 | 1 071 000 |

අමතර තොරතුරු පහත දැක්වේ.

- 2015.12.31 දිනට ඉතිරි බඩු තොගයේ පිරිවැය රු. 2 000 කි.

- අයිතිකරු විසින් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබාගෙන තිබූ රු. 3 000ක් පිරිවැය වූ භාණ්ඩ තොග පිළිබඳ ව කිසිදු සටහනක් නැත.
- බෙදාහැරීමේ වෑන්රථය 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතු ව ඇත.

**36.** මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙළ කරන ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු බෙදා හැරීමේ වියදම්වල එකතුව වනුයේ,

(1) රු. 31 000 කි. (2) රු. 33 000 කි. (3) රු. 50 000 කි. (4) රු. 51 000 කි.

**37.** මෙම ව්‍යාපාරයේ ජංගම වත්කම් පමණක් ඇතුළත් වන පිළිතුර වන්නේ,

(1) ණයහිමියෝ, මුදල් ශේෂය, ගොඩනැගිලි
(2) ණයගැතියෝ, බැංකු අයිරාව, මුදල් ශේෂය
(3) අවසන් තොගය, බෙදා හැරීමේ වෑන් රථය, මුදල් ශේෂය
(4) ණයගැතියෝ, මුදල් ශේෂය, අවසන් තොගය

**38.** මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ දළ ලාභය වන්නේ,

(1) රු. 115 000 (2) රු. 117 000 (3) රු. 120 000 (4) රු. 125 000

**39.** මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ ශුද්ධ ලාභය වන්නේ,

(1) රු. 20 000 (2) රු. 25 000 (3) රු. 29 000 (4) රු. 45 000

**40.** මෙම ව්‍යාපාරයේ 2015.12.31 දිනට හිමිකමේ වටිනාකම වන්නේ,

(1) රු. 826 000 (2) රු. 829 000 (3) රු. 832 000 (4) රු. 842 000

* *

# (60) ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* **පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද,** බැගින් තෝරා ගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක **(i)** සිට **(x)** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ව්‍යවසායකත්වය පිළිබඳ විශේෂ උපාධියක් හදාරා ඇති ලංකා, මල් පෝච්චි නිෂ්පාදනය කර විකිණීම සඳහා 'අලංකාර මල් පෝච්චි' නමින් ව්‍යාපාරයක් 2016.01.01 දින ආරම්භ කරන ලදී. එදින ම ව්‍යාපාරය සඳහා ඔහු සතු ව තිබූ රු. 500 000ක් වටිනා ඉඩම සහ මුදලින් රු. 300 000ක් යොදවන ලදී. තව ද 2016.01.02 දින රු. 30 000ක් වැය කර යන්ත්‍ර උපකරණ මිලදී ගත් අතර මල් පෝච්චි සකස් කිරීමේ අච්චු සඳහා රු. 20 000ක් වැය කරන ලදී. මෙම ව්‍යාපාරය සඳහා මල් පෝච්චි සකස් කිරීම පිළිබඳ මනා පළපුරුද්දක් ඇති ලංකාගේ මිතුරෙකු වන හසලක මල් පෝච්චි නිෂ්පාදනය කිරීමේ කටයුතු සඳහා සේවකයෙකු ලෙස බඳවා ගන්නා ලදී. 2016.01.03 වැනි දින රු. 50 000ක් තැන්පත් කර ව්‍යාපාර කටයුතු සඳහා ජංගම ගිණුමක් ආරම්භ කරන ලදී.

- 2016.01.31 දිනෙන් අවසන් වූ මාසය තුළ පහත ගනුදෙනු සිදුවී තිබුණි.

2016.01.04 වැලි සහ සිමෙන්ති මිල දී ගැනීම සඳහා චෙක්පතකින් රු. 25 000ක් ගෙවන ලදී.
2016.01.05 යන්ත්‍ර සඳහා ලිහිසි තෙල් මිල දී ගැනීමට වැය කළ මුදල රු. 1 200කි.
2016.01.20 මාසික විදුලි බිල ගෙවීම රු. 2 500කි.
2016.01.25 මල් පෝච්චි නිෂ්පාදනය කරන්නාට ගෙවූ වැටුප රු. 10 000ක් වූ අතර මුරකරුට ගෙවූ වැටුප රු. 6 000කි.

මෙම මාසය තුළ මිල දී ගත් සියලු ද්‍රව්‍ය භාවිත කර මල් පෝච්චි 500ක් නිෂ්පාදනය කළ අතර, එම මල් පෝච්චි සියල්ල ම ජනවාරි මාසය තුළ අලෙවි කරන ලදී. මල් පෝච්චියක නිෂ්පාදන පිරිවැයෙන් 25%ක ලාභාන්තිකයක් ලැබෙන පරිදි විකුණුම් මිළ තීරණය කර ඇත. තමා විසින් නිෂ්පාදනය කරන මල් පෝච්චි නගරයට රැගෙන ගොස් අලෙවි කිරීම සඳහා යොදා ගන්නා ලොරි රථයට ගෙවන මාසික කුලිය රු. 5 000ක් වේ. යන්ත්‍ර උපකරණ වාර්ෂිකව 12% බැගින් ක්ෂය කරනු ලැබේ.

(i) (අ) 'අලංකාර මල් පෝච්චි' ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(ආ) එම ව්‍යාපාර සංවිධාන වර්ගයේ දැකිය හැකි වාසියක් සහ අවාසියක් ලියන්න.

(ii) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් ලියන්න.
(ආ) අලංකාර ව්‍යාපාරයේ මල් පෝච්චි ප්‍රවාහනයට අදාළ ප්‍රවාහන මාර්ගය හා මාධ්‍යය දක්වන්න.

(iii) පහත දැක්වෙන ආකෘතිය භාවිත කරමින් මල් පෝච්චි නිෂ්පාදනයට අදාළ එක් එක් නිෂ්පාදන සාධකය සඳහා නිදසුන බැගින් ලියන්න.

| නිෂ්පාදන සාධක | නිෂ්පාදන සාධක සඳහා නිදසුන් |
|---|---|
| A - භූමිය | ............................................................... |
| B - ශ්‍රමය | ............................................................... |
| C - ප්‍රාග්ධනය | ............................................................... |
| D - ව්‍යවසායකත්වය | ............................................................... |

(iv) (අ) කළමනාකරණ ක්‍රියාවලියේ සංවිධානකරණ කාර්යයට අදාළ ව මෙම ව්‍යාපාරයේ දැකිය හැකි කටයුත්තක් ලියන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ සිදුවීම් දෙකක් පහත දැක්වේ.

A - 25% ක ලාභාන්තිකයක් සහිත ව මල් පෝච්චියක මිල තීරණය කිරීම.

B - මල් පෝච්චි නගරයට රැගෙන ගොස් අලෙවි කිරීම

ඉහත සිද්ධි දෙකට අදාළ අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වෙන වෙන ම දක්වන්න.

(v) 2016.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිත ව ලියා දක්වන්න.

(vi) 2016.01.04 දින මෙම ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනුව සටහන් කිරීමට අදාළ මූලාශ්‍ර ලේඛනය හා මූලික සටහන් පොත ලියන්න.

(vii) මෙම ව්‍යාපාරයේ බැංකු ගිණුම පිළියෙල කර 2016.01.31 දිනට තුලනය කර දක්වන්න.

(viii)(අ) 2016 ජනවාරි මාසයට අදාළ යන්ත්‍ර ක්ෂය ප්‍රමාණය කොපමණ ද?

(ආ) එම මාසයට අදාළ යන්ත්‍ර ක්ෂය ගිණුම්ගත කිරීම සඳහා ජ'නල් සටහන ලියා දක්වන්න.

(ix) (අ) මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ජංගම නොවන වත්කමක් ලියා දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ සිදුවී ඇති වත්කමක් අඩුවීමට හා වියදමක් වැඩිවීමට අදාළ ගනුදෙනුවක් ලියා දක්වන්න.

(x) (අ) මෙම ව්‍යාපාරයේ ජනවාරි මස නිෂ්පාදනය කරන ලද මල් පෝච්චියක ප්‍රාථමික පිරිවැය ගණනය කර දක්වන්න.

(ආ) මෙම ව්‍යාපාරයේ ජනවාරි මාසයේ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අයිතම **දෙකක්** අගයන් සහිත ව ලියා දක්වන්න. (ලකුණු 02 × 10 = 20)

---

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

---

**2.** (i) (අ) මිනිස් අවශ්‍යතා යනු කුමක් ද? (ලකුණු 01)

(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න. (ලකුණු 01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරය පිළිබඳ උනන්දුවක් දක්වන විවිධ පාර්ශ්ව කොටස්කරුවන් වේ.

(ආ) ව්‍යාපාරයේ සේවකයින්ගේ විශේෂඥ දැනුම එම ව්‍යාපාරයේ අවස්ථාවකි.

(ඉ) නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර, නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනයට අයත් වේ.

(ඊ) රියදුරු පුහුණු පාසල, සේවා සපයන ව්‍යාපාරයකි. (ලකුණු 02)

(iii) ප්‍රියවතී විසින් සෞඛ්‍යය ආරක්ෂිත ව පිළියෙල කර පාසලේ ආපන ශාලාවට සපයන බත් පාර්සල් සඳහා ශිෂ්‍යයින් සහ ගුරුභවතුන් වැඩි කැමැත්තක් දක්වයි.

(අ) පාසලේ ආපන ශාලාව කෙරෙහි උනන්දුවක් දක්වන මෙම සිද්ධියේ සඳහන් වන පාර්ශ්ව **දෙකක්** ලියන්න. (ලකුණු 01)

(ආ) ඉහත "අ" සඳහා ඔබ සඳහන් කළ එක් එක් පාර්ශ්වය ආපන ශාලාව කෙරෙහි උනන්දුවීමට හේතුව බැගින් ලියන්න. (ලකුණු 01)

(iv) කිරි එළදෙනුන්ගේ ගොවිපලක් පවත්වාගෙන යන අමරපාල කාබනික පොහොර නිෂ්පාදනය කිරීමට අදහස් කරයි. තව ද මෙම වකවානුව තුළ රසායනික පොහොර භාවිතය හැකිතාක් අවම කිරීමට රජය දැඩි අවධානයක් යොමු කර ඇත.

අමරපාලගේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපාරයේ,

(අ) අවස්ථාවක්

(ආ) ශක්තියක් ලියන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 08)

**3.** (i) (අ) චෙක්පතක් පිටසන් කිරීම යනු කුමක් ද? (ලකුණු 01)
(ආ) චෙක්පතකට සම්බන්ධ පාර්ශ්ව නම් කරන්න. (ලකුණු 01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සීමිත වගකීමක් සහිත ව ලියාපදිංචි කිරීම ඒකපුද්ගල ව්‍යාපාරවල විශේෂ ලක්ෂණයකි.
(ආ) ව්‍යාපාරයක කළමනාකරුවන් විසින් සැපයුම්කරුවන් සමඟ සිදු කරනු ලබන සන්නිවේදනය බාහිර සන්නිවේදනය වේ.
(ඉ) විවිධ ප්‍රවාහන මාර්ගවල ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා යාන වාහන ප්‍රවාහන මාර්ගය ලෙස හැඳින්වේ.
(ඊ) රක්ෂණ ආවරණය ලබන පාර්ශ්වය රක්ෂිතයා වන අතර රක්ෂණ ආවරණය ලබාදෙන පාර්ශ්වය රක්ෂකයා වේ. (ලකුණු 02)

(iii) කල්පිටියේ මත්ස්‍ය කර්මාන්තයේ යෙදෙන ධීවරයින් 30 දෙනෙකු ස්වේච්ඡාවෙන් එකතු වී තම මත්ස්‍ය නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමේ අරමුණෙන් ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වන ස්වාධීන සංවිධානයක් ආරම්භ කිරීමට අදහස් කරයි.

(අ) ඉහත ධීවර නිෂ්පාදකයින් සඳහා ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද? (ලකුණු 01)
(ආ) ඉහත (iii) (අ) සඳහා ඔබ යෝජනා කළ සංවිධාන ක්‍රමයේ වාසියක් හා අවාසියක් ලියන්න. (ලකුණු 01)

(iv) මල් ශාලාවක් පවත්වාගෙන යන මාලි, මල් තොගයක් දුම්රියෙන් එවන ලෙස සැපයුම්කාරිය වන කුමාරිට දුරකථනයෙන් දැනුම් දෙන ලදී. කුමාරි එය පිළිගනිමින් එදින ම ගමන් ගන්නා දුම්රියකින් මල් තොග එවීමට එකඟ විය.

(අ) මල් තොගය එවීමට මාලී දුම්රිය තෝරා ගැනීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 01)
(ආ) ඉහත සිද්ධියට අදාළ සන්නිවේදන ක්‍රියාවලිය ගැලීම් සටහනක් ආකාරයෙන් ලියන්න. (ලකුණු 01)
(මුළු ලකුණු 08)

**4.** (i) (අ) කළමනාකරණය යනු කුමක් ද? (ලකුණු 01)
(ආ) අලෙවිකරණ මිශ්‍රයේ ඇතුළත් විචල්‍ය මොනවා ද? (ලකුණු 01)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

(අ) සැලසුම්කරණ ලද ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ දී අවශ්‍ය සම්පත්, තනතුරු හා වැඩ බෙදා හැරීම සම්බන්ධ කටයුතු මෙහෙයවීමයි.
(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකිරීම සඳහා වෙළෙඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩ පමණක් නිෂ්පාදිත ලෙස හැඳින්වේ.
(ඉ) කොළඹ කොටස් වෙළෙඳපොළ කටයුතු අධීක්ෂණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යි.
(ඊ) රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා සඳහා යොදා ගන්නා මූල්‍ය උපකරණයකි භාණ්ඩාගාර බිල්පත්. (ලකුණු 02)

(iii) පාසල් බෑග් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් විසින් අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

අ. නිෂ්පාදිත පාසල් බෑග් ප්‍රමිතියට අනුකූල දැයි පරීක්ෂා කිරීම
ආ. පාසල් බෑග් මැහුම්කරුවන් බඳවා ගැනීම
ඉ. බැංකු ණයක් ලබා ගැනීමට තීරණය කිරීම
ඊ. පාසල් බෑග් මැහුම්කරුවන්ට අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබාදීම

ඉහත පියවර කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් කාර්යය යටතේ දක්වන්න. (ලකුණු 02)

(iv) පාසලක් අසල පොත් හා පාසල් උපකරණ අලෙවිසලක්, මුදිත විසින් පවත්වාගෙන යයි. ඔහුගේ විකුණුම් ප්‍රමාණය ඉහළ නංවා ගැනීම සඳහා සෑම සිකුරාදා දිනක ම රු. 500 ඉක්මවන මිලදී ගැනීම් සඳහා 10%ක වෙළෙඳ වට්ටමක් හා ක්‍රීඩා උපකරණයක් හිමිකරගත හැකි ලොතරැයිපතක් ලබා දෙයි.

(අ) මුදිතගේ ව්‍යාපාරයේ ඉලක්ක වෙළෙඳපොළ කුමක්ද? (ලකුණු 01)

(ආ) මුදිත විකුණුම් ප්‍රමාණය ඉහළ නංවා ගැනීමේ පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා යොදාගෙන ඇත්තේ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍ය ද? (ලකුණු 01)

(මුළු ලකුණු 08)

---

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)

---

**5.** (i) (අ) ගිණුම්කරණයේ අරමුණ කුමක් ද?

(ආ) වත්කමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ධනුකගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයේ මුල් සතිය තුළ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ.

1. 2016.01.01 ප්‍රාග්ධනය ලෙස මුදල් යෙදවූවා රු. 600 000
2. 2016.01.03 අත්පිට මුදලට ගැනුම් රු. 200 000
3. 2016.01.05 බැංකුවෙන් ණය මුදලක් ලබා ගත්තා රු. 250 000
4. 2016.01.06 අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5 000ක බඩු තොගයක් ගත්තා.
5. 2016.01.07 වැටුප් ගෙව්වා රු. 3 000

ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. ඒ සඳහා පහත ආකෘතිය භාවිත කරන්න. (1) වන ගනුදෙනුව සටහන් කරන ආකාරය නිදසුනක් ලෙස දක්වා ඇත.

| ගනුදෙනු අංක | වත්කම් = | හිමිකම් + | වගකීම් |
|---|---|---|---|
| 1 | මුදල්<br>+ 600 000 | + 600 000 | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

(ලකුණු 02)

(iii) සුනිමල්ගේ ව්‍යාපාරයේ 2016 මාර්තු මාසයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංකය | සැපයුම්කරු | ඉන්වොයිසියේ සඳහන් ශුද්ධ වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2016.03.02 | 125 | ජයවර්ණ | 11 250 |
| 2016.03.08 | 445 | බලදේව | 7 200 |
| 2016.03.15 | 140 | සුරම්‍යා | 6 750 |

අවශ්‍ය වන්නේ,

(අ) මාර්තු මාසයට අදාළ ගැණුම් ජ'නලය පිළියෙල කිරීම

(ආ) අදාළ ලෙජර් ගිණුම් පිළියෙළ කිරීම (ලකුණු 04)

(iv) කෝසලගේ ව්‍යාපාරයේ 2016 පෙබරවාරි මාසයේ පළමු දෙසතිය තුළ සිදුවූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 2016.02.01 | අග්‍රිමය ලැබුණා | 2 000 |
| 2016.02.01 | ගමන් වියදම් | 160 |
| 2016.02.02 | ලිපි ද්‍රව්‍ය වියදම් | 130 |
| 2016.02.03 | ගෙන ඒමේ කුලී | 150 |
| 2016.02.06 | සංග්‍රහ වියදම් | 165 |
| 2016.02.07 | කුලී රථ ගාස්තු | 150 |
| 2016.02.08 | කම්කරු කුලී | 150 |
| 2016.02.09 | පරිගණක උපකරණ | 500 |
| 2016.02.10 | කාබන් කොළ | 110 |
| 2016.02.11 | සංග්‍රහ වියදම් | 125 |
| 2016.02.13 | පරිත්‍යාග | 200 |
| 2016.02.14 | ලිපිද්‍රව්‍ය වියදම් | 130 |
| 2016.02.15 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | |

අවශ්‍ය වන්නේ,

- ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය වියදම්, සංග්‍රහ වියදම්, විවිධ වියදම් යන විශ්ලේෂණ තීරු සහිත 2016 පෙබරවාරි මාසයට සුළු මුදල් පොත පිළියෙල කිරීම. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

**6.** (i) (අ) නිෂ්පාදිතයක මිල තීරණය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 01)

(ආ) බැංකු ප්‍රකාශය යනු කුමක් ද? (ලකුණු 01)

(ii) ගුණසිරි විසින් ගඩොල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහු විසින් 2016 ජනවාරි මාසයේ ගඩොල් නිෂ්පාදනය සඳහා දරන ලද පිරිවැය පහත දැක්වේ.

| | රු. |
|---|---|
| මැටි | 25 000 |
| ගඩොල් කපන්නගේ වැටුප | 30 000 |
| දර | 15 000 |
| මැටි ප්‍රවාහන වියදම් | 5 000 |
| ජල බිල්පත | 5 000 |

ජනවාරි මාසයේ නිෂ්පාදනය කළ ගඩොල් ප්‍රමාණය 10 000ක් වේ.

ගඩොල් කැටයක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න. (ලකුණු 02)

(iii) 2016 ජනවාරි මස 31 දිනට වික්‍රමගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 40 000ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ සඳහන් වටිනාකම එයට වෙනස් විය. වෙනසට හේතු වශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

- බැංකුව වෙත සෘජුව ම ණයගැතියන් ප්‍රේෂණය කර තිබූ මුදල රු. 6 000කි.
- තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත රු. 7 000ක් විය.
- රු. 500 ක බැංකු ගාස්තුවක් බැංකුව අයකර ගෙන තිබිණ.
- නිකුත් කළ නමුත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 5 000කි.

අවශ්‍ය වන්නේ ;

(අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.

(ආ) 2016.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කර එදිනට බැංකු ප්‍රකාශයේ පැවති ශේෂය දැක්වීම. (ලකුණු 04)

(iv) තරිඳුගේ ව්‍යාපාරයේ 2016.01.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුමේ එකතුව සමාන නොවූ අතර වෙනස වූ රු. 7 200 අවිනිශ්චිත ගිණුමට හර කරන ලදී. පසුව කළ සෝදිසි කිරීමේ දී පහත වැරදි අනාවරණය විය.

- රු. 5 000ක විකුණුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් වීම
- රු. 8 000ක විදුලි ගාස්තු ගෙවීම විදුලි ගාස්තු ගිණුමේ සටහන් වී ඇත්තේ රු. 800ක් ලෙස ය.
- රු. 2 000ක රක්ෂණ ගාස්තු ගෙවීම පොත්වල සම්පූර්ණයෙන් ම සටහන් වී නොතිබීම.

අවශ්‍ය වන්නේ ;

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් ලියා දක්වන්න.

(ආ) අවිනිශ්චිත ගිණුම පිළියෙළ කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 12)

**7.** (i) (අ) ව්‍යාපාරයක දැකිය හැකි ජංගම නොවන වගකීමක් ලියන්න. (ලකුණු 01)

(ආ) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර විසින් පිළියෙල කරනු ලබන ලැබීම් හා ගෙවීම් ගිණුම සහ ආදායම් ප්‍රකාශය අතර ඇති වෙනස්කමක් ලියන්න. (ලකුණු 01)

(ii) එක්සත් ක්‍රීඩා සමාජයේ සාමාජිකයින් සංඛ්‍යාව 100කි. එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 600කි. එහි භාණ්ඩාගාරික විසින් 2016.03.31 දිනට ඉදිරිපත් කළ ලැබීම් හා ගෙවීම් ගිණුම පහත දැක්වේ.

**ලැබීම් හා ගෙවීම් ගිණුම**

| | | | |
|---|---|---|---|
| 2016.03.01 දින ශේෂය | 10 000 | ජල බිල ගෙවීම | 800 |
| ලද සාමාජික මුදල් | 2 500 | සංග්‍රහ වියදම | 2 000 |
| පත්තර විකුණා ලද මුදල් | 1 000 | ලිපි ද්‍රව්‍ය | 200 |
| | | කම්කරු කුලී ගෙවීම | 1 500 |
| | | ගමන් ගාස්තු | 400 |
| | | ශේෂය ප/ ගෙ | 8 600 |
| | 13 500 | | 13 500 |
| ශේෂය ඉ/ ගෙ | 8 600 | | |

මෙම ක්‍රීඩා සමාජයේ මාර්තු මාසය සඳහා ගොඩනැගිලි කුලිය රු. 2 000ක් ගෙවිය යුතු ව ඇත.

අවශ්‍ය වන්නේ :

එක්සත් ක්‍රීඩා සමාජයේ 2016.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීම. (ලකුණු 02)

(iii) සපුමල්ගේ වෙළෙඳ ව්‍යාපාරයේ 2015.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගැණුම් | 450 000 | |
| විකුණුම් | | 590 000 |
| ගොඩනැගිලි - පිරිවැයට | 300 000 | |
| උපකරණ - පිරිවැයට | 50 000 | |
| 2015.01.01 දිනට ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් | | 30 000 |
| 2015.01.01 දිනට තොගය | 12 000 | |
| දුන් වට්ටම් | 1000 | |
| ලද වට්ටම් | | 5 500 |
| රක්ෂණය | 5 500 | |
| ප්‍රචාරණය | 25 000 | |
| බැංකු ණය 15% | | 50 000 |
| බැංකු ණය පොළී | 7 500 | |
| ණයගැතියෝ | 18 000 | |
| ණයහිමියෝ | | 23 000 |
| මුදල් | 29 500 | |
| 2015.01.01 දිනට ප්‍රාග්ධනය | | 200 000 |
| | 898 500 | 898 500 |

අමතර තොරතුරු පහත දැක්වේ.

(i) 2015.12.31 දිනට ඉතිරි බඩු තොගය රු. 12 000කි.

(ii) ණයගැතියන්ගෙන් රු. 2 000ක් බොල්ණය කපාහැරිය යුතු ය.

(iii) ගොඩනැගිලි සහ උපකරණ වාර්ෂික ව පිරිවැය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.

අවශ්‍ය වන්නේ,

(අ) 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 04)

(ආ) 2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04)

(මුළු ලකුණු 12)

* * *